රිදීගම ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 07 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට රිදීගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සභාව විසින් භාවිතා කරන ලද රු.65,644,929 ක් වටිනාකමැති වාහන 07 ක් සභාව නමට පවරා ගැනීමෙන් තොරව මෝටර් රථ හා කරත්ත ගිණුම තුළ සටහන් කර තිබුණි.

#### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) ලැබිය යුතු ගිණුම්**

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම්වල වටිනාකම රු. 50,314,060ක් වූ අතර 2016 මාර්තු විගණන දිනය වන විට එයින් රු.18,640,170 ක මුදලක් අයවී තිබූ අතර තවදුරටත් හිඟහිටි ශේෂයේ වටිනාකම රු.31,673,890 ක් වී තිබුණි.

(ii) සේවක ණය ලේඛනය අනුව විශ්‍රාමික නිලධාරීන් 03 දෙනෙකුගෙන් රු.130,079 ක්ද ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් රු.12,835 ක්ද, මියගිය එක් අයෙකුගෙන් රු.4,000 ක්ද වශයෙන් ණය හා අත්තිකාරම් රු.146,914 ක් මාස 03 සිට වසර 03 දක්වා කාලයක සිට අය නොවී පැවතින.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.31,210,196 ක ආදායම් ණයගැති ශේෂය තුළ වසර 03 ට වැඩි අයනොවී පවතින ශේෂයන්ගේ වටිනාකම රු.1,878,708 ක් විය.

**(ආ)** **<u>ගෙවිය යුතු ගිණුම්</u>**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම්වල වටිනාකම රු. 31,800,709 ක් වූ අතර එයින් වසර 03 කට වැඩි කාලයක සිට පැවතුණ ශේෂයන්ගේ වටිනාකම රු. 4,096,728 ක් විය.

### 1.3.3 නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

වරිපනම් ගෙවීම් පැහැර හැරි තැනැත්තන්ට යැවිය යුතු අවසන් නිවේදන 41 ක් සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) (ආ) වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,929,817ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.6,564,006 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,365,811 ක වර්ධනයක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.101,499,775 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.106,913,333 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.3,516,259 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තත්‍ය ආදායම, වියදම හා අදාල විචලනයන් පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ආදායම 2015 | ආදායම 2014 | විචලනය | වියදම් විෂයය | වියදම 2015 | වියදම 2014 | විචලනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) | උත්පාදිත ආදායම | 9,004 | 6,707 | 2,297 | පෞද්ගලික පඩිනඩි | 42,660 | 32,159 | 10,501 |
| (ii) | වෙනත් | 53,132 | 53,084 | 48 | අනෙකුත් | 10,547 | 21,068 | (10,521) |
| | උප එකතුව | 62,136 | 59,791 | 2,345 | උප එකතුව | 53,207 | 53,227 | (20) |
| (iii) | ප්‍රාග්ධන ආදායම | 101,500 | 57,510 | 43,990 | ප්‍රාග්ධන වියදම | 106,913 | 64,683 | 42,230 |
| | මුළු එකතුව | 163,636 | 117,301 | 46,335 | මුළු එකතුව | 160,120 | 117,910 | 42,210 |
| | මෙහෙයුම් ප්‍රතිඵලය | 8,930 | 6,564 | 2,366 | අතිරික්තය/ ඌනතාවය | 3,516 | (609) | 2,907 |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.62,136,252 න් සියයට 85 ක් හෙවත් රු.53,132,414 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.101,499,775 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මඟින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.53,206,435 න් සියයට 80 ක් හෙවත් රු.42,659,857 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් සියයට 97 ක් හෙවත් රු.41,210,231 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණු අතර එම වටිනාකම වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.106,913,333 න් සියයට 07 ක් හෙවත් රු.7,615,284 ක් පමණක් සභා අරමුදලින් වැය කර තිබූ අතර ඉතිරි සියයට 93 ක් වූ රු.99,298,049 ක

ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදන මත ඉටුකල සංවර්ධන කාර්යයන් විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂ හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි විය.

| | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තු ගත | තත්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 2,692 | 1,809 | 2,798 | 2,532 | 1,659 | 2,976 |
| (ii) බදුකුලී | 4,384 | 3,544 | 456 | 3,178 | 2,489 | 361 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,023 | 1,045 | 367 | 1,069 | 650 | 523 |
| (iv) වෙනත් ආදායම් | 59,232 | 37,393 | 27,067 | 52,533 | 5,339 | 56,927* |
| එකතුව | 67,331 | 43,791 | 30,688 | 59,312 | 10,137 | 60,787 |

### 2.3.2 බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම්

විස්තර පහත දැක්වේ.

| | | | | ආදායම් රැස් කිරීම | | | හිඟහිටි ශේෂය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම් | එකතුව | 2015/01/01 දක්වා හිඟයෙන් | බිල්කළ ආදායමින් | එකතුව | 2015/01/01 දිනට පැවති හිඟයෙන් | බිල්කළ ආදායමින් | 2015/12/31 දිනට ගණනය කිරීම් අනුව ශේෂය |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු.000 |
| වරිපනම් හා බදු | 2,989 | 2,557 | 5,546 | 939 | 1,809 | 2,748 | 2,050 | 748 | 2,798 |
| බදු කුලී | 362 | 3,665 | 4,027 | 27 | 3,544 | 3,571 | 335 | 121 | 456 |
| බලපත්‍ර ගාස්තු | 523 | 1,045 | 1,568 | 156 | 1,045 | 1,201 | 367 | - | 367 |
| * වෙනත් ආදායම් | 31,038 | 56,605 | 87,643 | 21,447 | 39,129 | 60,576 | 9,592 | 17,475 | 27,067 |
| එකතුව | 34,912 | 63,872 | 98,784 | 22,569 | 45,527 | 68,096 | 12,344 | 18,344 | 30,688 |

* 2015 ජනවාරි 01 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව වෙනත් ආදායම් හිඟ ශේෂය රු.56,927 ක් වුවද, සභාව විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව එම ශේෂය රු.31,038 ක් විය.

### 2.3.3 වරිපනම් හා බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.2,989,535 ක් වූ හිඟ වරිපනම් හා බදු වලින් සියයට 31 ක් හෙවත් රු.938,963 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ අයවී තිබුණු අතර තවදුරටත් සියයට 69 ක් හෙවත් රු.2,049,572 ක් අයවීමට තිබුණි.

(ආ) වර්ෂයේ බිල්කළ ආදායම රු.2,557,029 ක් වූ අතර ඉන් සියයට 71 ක් හෙවත් රු.1,809,388 ක් අයකර තිබුණු අතර සියයට 29 ක් හෙවත් රු.747,641 ක් හිඟව පැවතුණි.

### 2.3.4 බදු කුලී

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.361,684 ක් වූ හිඟයෙන් සියයට 7 ක් හෙවත් රු.27,217 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන තිබුණු අතර සියයට 93 ක් හෙවත් රු.334,467 ක් අයවීමට තිබුණි.

### 2.3.5 බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ බලපත්‍ර ගාස්තු ආදායම රු.523,364 න් සියයට 29 ක් හෙවත් රු.155,600 ක් පමණක් වර්ෂය තුළ අයකර ගෙන තිබුණු අතර සියයට 71 ක් හෙවත් රු.367,764 ක් තවදුරටත් අයවීමට තිබුණි. තවද හිඟ ශේෂ සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3.6 වෙනත් ආදායම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ වෙනත් ආදායම් රු.24,793,448 ක් පැවති අතර එයින් සියයට 38 ක් හෙවත් රු.9,515,895 ක් දෙසැම්බර් 31 දිනට තවදුරටත් හිඟව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත වෙනත් ආදායම් රු.10,264,997 ක් වූ අතර ඉන් සියයට 02 ක් හෙවත් රු.264,997 ක් පමණක් වර්ෂය තුළ අයකරගෙන තිබුණි. සියයට 98 ක් හෙවත් රු.10,000,000 ක් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟව පැවතුණි.

**2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත උසාවි දඩ හා මුද්දර ගාස්තු වටිනාකම රු.10,165,176 ක් වූ අතර එයින් රු.2,165,176 ක් සමාලෝචිත වර්ෂය අවසානයට අයකරගත යුතුව පැවතුණි.

**2.3.8 අක්කර බදු**

වර්ෂයේ ආරම්භක හිඟ අක්කර බදු ප්‍රමාණය රු.230,029 ක් වූ අතර වර්ෂය තුලදී එයින් සියයට 8 ක් හෙවත් රු.19,724 ක් පමණක් අයවී තිබුණි. ඉතිරි රු. 210,305 ක මුදල ගිණුම් විගණන දින වන විටත් අයකර ගැනීමට තිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාවේ කාර්යය මණ්ඩල තනතුරු 10 කට අදාලව පුරප්පාඩු 15 ක් පැවතුණි.

(ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 අයවැය චක්‍රලේඛය මගින් රාජ්‍ය සේවයට බඳවා ගන්නා ලද සේවකයින්ගේ වැටුප් වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස් වෙතින් ප්‍රතිපූර්ණ කළයුතු රු.2,268,401 ක මුදල ලැබී නොතිබුණු බැවින් එම වැටුප් සහා අරමුදල් මඟින් ගෙවීම් කර තිබුණු අතර එය සභාවේ අරමුණු ඉටු කිරීම සඳහා අහිත කර ලෙස බලපා තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී සභාවට විරුද්ධව පවරා ඇති නඩු කටයුතු වෙනුවෙන් නීතිඥ ගාස්තු ලෙස රු.287,100 ක් ගෙවා තිබුණි.

(ආ) පස් ලබා ගැනීම සඳහා සභාව සතු ඉඩම් තිබියදී ඒවායින් පස් ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේදී රිදීගම ආදාහනාගාර භූමිය පිරවීම සඳහා රු.310,500 ක් වැයකර තිබුණි.

## 04 යහපාලනය හා ගිණුම්කටයුතු භාවය

### 4.1 වත්කම් කළමනාකරණය

#### 4.1.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2015 පෙබරවාරි 05 දින රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් සභාව වෙත ලැබී තිබුණු රු.1,066,200 ක් වටිනා ලෙලෙන යන්ත්‍රය සමාලෝචිත වර්ෂය තුළදී නිෂ්ක්‍රීයව පැවති අතර එම යන්ත්‍රය යොදා සිදු කරගත හැකි සභාවේ කාර්යයන් සඳහා බාහිර ආයතනවලින් යන්ත්‍ර කුලියට ගෙන ගෙවීම් කර තිබුණි.

## 05 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය